රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 04/94

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.
1994.01.22 වෙනි දින.

සියළුම ලේකම්වරුන් සහ,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## රජයේ නිවාඩු නිවාස වෙන් කිරීමේ ක්‍රමය, ගාස්තු අය කිරීමේ ක්‍රමය සංශෝධනය කිරීම.

රජයේ නිවාඩු නිවාස වෙන් කිරීමේ ක්‍රමය, ගාස්තු අය කිරීමේ ක්‍රමය 1994 ජනවාරි මස 01 වැනි දින සිට පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

02. නිවාඩු නිවාස වෙන් කිරීම:

2.1 නිවාඩු නිවාසය ඉල්ලුම්කරුට වෙන් කර ගත හැකිදැයි ආයතන අධ්‍යක්ෂ විමසා තහවුරු කර ගත යුතුය.

නියමිත කුලිය රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී
වෙත ගෙවිය යුතුය.

ගෙවීම් පිළිබඳ ලදුපත ආයතන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කර, නිවාස වෙන් කිරීමේ ලිපිය ලබා ගත යුතුය.

2.II නිවාඩු නිවාස වෙන් කිරීම පිළිබඳ ආයතන සංග්‍රහයේ XX වන පරිච්ඡේදයේ විධිවිධාන කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

දෙසැම්බර්/ජනවාරි, අප්‍රේල්/මැයි, සහ අගෝස්තු/සැප්තැම්බර් මාසවලදී නිවාඩු නිවාස පිළිබඳ ඉල්ලුම්පත්‍ර අවම වශයෙන් මාස 03 කට පෙර ඉදිරිපත් කළ යුතු වේ.

03. ගාස්තු :

3.1 නිවාස වෙන් කිරීමේ කොන්දේසි අනුව, නැවතීම සඳහා දිනකට අය කරනු ලබන ගාස්තු පහත සඳහන් පරිදිය.

* නුවරඑළිය - රු. 110.00
* දියතලාව 'ඒ' - රු. 100.00
* දියතලාව 'බී' - රු. 90.00
* බණ්ඩාරවෙල I, II - රු. 80.00

3.II විදුලි ගාස්තු :

දිනකට පාවිච්චි කරනු ලබන විදුලි ඒකක 6 දක්වා වන ගාස්තුව දෛනික නිවාස කුලියට ඇතුලත්ය. පාවිච්චි කරන අතිරේක ඒකක සඳහා විදුලි බල මණ්ඩලයේ ගාස්තු අනුව නියමිත මුදල නිවාසයෙන් පිටවීමට පෙර බංගලා භාරකරු වෙත ගෙවා ලදුපතක් ලබා ගත යුතුය.

**3**.III <u>දුරකථන ගාස්තු හා රෙදි සේදීමේ ගාස්තු :</u>

දුරකථන ගාස්තු ද, වරින්වර නියස කරනු ලබන පරිදි, රෙදි සේදීමේ ගාස්තු ද, බංගලා භාරකරු වෙත මුදලින් ගෙවා ලදුපතක් ලබා ගත යුතුය.

04. මේ අනුව ආයතන සංග්‍රහයේ XX වන පරිච්ඡේදය සංශෝධනය කරනු ඇත.

අ.කලේ(වයි.බී.පුස්සෙදෙනිය)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.